කොවිඩ්-19 වසංගතයෙන් ආරක්ෂා වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳව සිහි සිහිකැඳවීම උදෙසා මාධ්‍ය මගින් මෙහෙයුම් සිදු කරයි. නමුත් එම ඇතැම් මෙහෙයුම් ඔස්සේ, පුද්ගලයින්ට සිය පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතියත් පුද්ගල ගරුත්වයත් උල්ලංඝනය වීම කණගාටුවට කරුණකි.

උදාහරණයක් ලෙස අද දෙරණ ප්‍රධාන පුවත් විකාශය ඔස්සේ මුඛ ආවරණ පැළඳ නොමැති අයවලුන්ව අදාළ නාලිකාව මගින් ප්‍රශ්න කරනු දැක්වෙන දර්ශන ඉදිරිපත් කළ හැක. එසේම මෙහිදී ඇතැමෙකුගේ අනන්‍යතාවය හඳුනා ගැනීම අසීරු වන ලෙස කළු කොටුවකින් ඔවුන්ගේ දෑස් වැසීම සිදු කළත්, තවත් අයවලුන්ගේ අනන්‍යතාවය කිසිදු සැඟවීමකින් තොරව දක්වා තිබිණි.

පවත්නා තත්ත්වය යටතේ වසංගතයෙන් ආරක්ෂාවීමට නිර්දේශ කර ඇති විධිවිධාන මහජනතාව විසින් පිළිපැදිය යුතු බව පෙන්වා දීම කාලීන වශයෙන් යහපත් වේ. එනමුත්, ඒ සඳහා පෞද්ගලිකත්වයට ඇති අයිතිය සහ පුද්ගල ගරුත්වය උල්ලංඝනය කිරීම සාධාරණීකරණය කළ හැකිද? පුද්ගල ගරුත්වය ආරක්ෂා කරමින් මෙම දර්ශන ඉදිරිපත් කිරීමට නොහැකිද?

**#MediaEthicsSL #lka #SinhalaNews #TV #channels #AdaDerana #COVID19 #Coronavirus**

See Less